රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:-15/2000

මගේ අංකය:ආ/1/4/4(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2000 සැප්තැම්බර් මස 07 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## සියළුම රාජ්‍ය සේවකයින්ට විශ්‍රාම වැටුප් රහිත අතුරු දීමනාවක් සහ සියළුම විශ්‍රාමිකයින්ට මාසික දීමනාවක් ගෙවීම

රුපියල් එක් දහසක මාසික අවමයකට යටත්ව 2000 ඔක්තෝම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළුම රාජ්‍ය සේවකයින්ට තම මාසික වැටුපින් 10% ක විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් (දෙකින් ඉහළ දීමනාව) ගෙවීමට රජය තීරණය කර ඇත. 2000 ජූලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2000 න් සළසා ඇති පරිදි රුපියල් 12,000/- ට නොවැඩි මාසික වැටුපක් හිමි රාජ්‍ය සේවකයින්ට 2000.08.01 දින සිට ගෙවනු ලැබූ රු.600/- ක අතුරු දීමනාවද මෙම දීමනාවට අන්තර්ගත කර ඇත.

02. දෛනික වැටුප් ලබන සේවකයන්ටද වැඩකරන දිනකට රු.47.62 ක අවමයකට යටත්ව මසකට දින 21 ක උපරිමයක් දක්වා මෙම දීමනාව ගෙවිය යුතුය.

03. විශ්‍රාමිකයින් සඳහාද රු.500/-ක මාසික අවමයකට යටත්ව විශ්‍රාම වැටුපින් 10% ක දීමනාවක් 2000 ඔක්තෝම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතුය. 2000 ජූලි 12 දිනැති 04/2000 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් අනුමැතිය දී ඇති රු.300/- ක මාසික දීමනාවද මෙම 10% දීමනාවට අන්තර්ගත කර ඇත.

04. දනට ක්‍රියාත්මක වන වැටුප් කොමිෂම - 2000 සහ විශ්‍රාම වැටුප් පිළිබඳ කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේදී මෙම දීමනාවන් සමාලෝචනය කෙරෙනු ඇත.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

මහින්ද බන්දුසේන
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත ලේකම්

ච/ch-ant/3